**IPRC/16/263**

# පැරණි ශ්‍රී ලාංකීය දේශපාලන සංවිධානය තුළ භික්ෂුවගේ ක්‍රියාකාරීත්වය (අනුරාධපුර යුගයේ සිට දඹදෙණි යුගය අවසානය දක්වා ප්‍රාථමික මූලාශ්‍රය ඇසුරින් කෙරෙන අධ්‍යයනයකි)

මංජුල ප්‍රේමරත්න[1*]

දේශපාලනය භික්ෂුවගේ ආකල්පයන්ට එතරම් විෂය නොවන නමුදු සමාජය හැසිරවීමේ මූලික උපාංගය වූ පාලන සංවිධානය යහපත් මාර්ගයට යොමුකරලීමේ දි භික්ෂුවගේ දායකත්වය ඉතා වැදගත් විය. මූලාශ්‍රයට අනුව ඍජුව ම දේශපාලනය කෙරෙහි භික්ෂුවගේ බලපෑම නොතිබුණ ද වක්‍රාකාරයෙන් ඇති කළ බලපෑම පාලන සංවිධානයේ හැඩ ගැසීමට බෙහෙවින් හේතුභූත විය. ඒ අනුව මෙම පර්යේෂණයෙන් විමර්ශනයට ලක් කෙරෙන්නේ පැරණි ශ්‍රී ලාංකීය දේශපාලන සංවිධානය තුළ භික්ෂුවගේ ක්‍රියාකාරීත්වය කෙසේ වී ද යන්න පිළිබඳ ව යි. එය පර්යේෂණ ගැටලුව බවට පත්විය.

මෙහිදී අධ්‍යයන ක්‍රමවේදය වූයේ මූලාශ්‍රය අධ්‍යයනය යි. විශේෂයෙන් ම ප්‍රාථමික මූලාශ්‍රය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී.

පාලන ක්‍රියාවලිය තුළ ලංකාව වැනි රටකට භික්ෂුවගේ දායකත්වය අවශ්‍ය ද යන්න සොයාබැලීම මෙහි අරමුණ යි. පාලක පන්තියට අවශ්‍ය වූ අධ්‍යාපන ඥානය බොහෝදුරට ලබාදුන්නේ භික්ෂූන් අතිනි. එනයින් බලන කල භික්ෂූන් පාලක පන්තියේ ආචාර්යවරයන් ද විය. එමෙන් ම මුල්කාලීන ව පුරෝහිතයාගෙන් ඉටු වූ කාර්යය පැවරුණේ ද භික්ෂූන්ට ය. ඒ අනුව සෑම විශේෂිත අවස්ථාවක ම පාහේ භික්ෂූන්ගේ උපදේශකත්වය පාලකයන්ට ඉතා වැදගත් වූ බව මෙම පර්යේෂණය තුළින් පෙනී යයි. එපමණක් නොව ඇතැම් විට ඉතා තීරණාත්මක අවස්ථාවන්හි දී භික්ෂුව පාලකයාගේ ආරක්ෂකයා බවට ද පත්විය. මේ අනුව ශ්‍රී ලාංකීය දේශපාලන සංවිධානය තුළ භික්ෂුවගේ මැදිහත් වීම නිසා යහපත් මෙන් ම අයහපත් ප්‍රතිඵල ද ඇති වූ නමුත් මෙය සසුනේ දියුණුවට හා ස්ථාවරත්වයට හේතු වූ බව නිගමනය කළ හැකි ය. එමෙන් ම මේ තත්ත්වය භික්ෂුව පසුකාලීන ව දේශපාලන සංවිධානය තුළට එක්වීමට හේතුකාරකයක් වූ බවත් රජුගේ අත්තනෝමතිකත්වයට සීමාවක් වූ බවත් නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** *භික්ෂුව, පාලන සංවිධානය, දේශපාලනය, ක්‍රියාකාරීත්වය.*

[1] කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව *kethumathitemple@gmail.com